**යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2021**

---

යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සහ 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3603-එස්ආර්අයි හා අංක 3604-එස්ආර්අයි (අතිරේක මූල්‍යනය) ණය ගිවිසුමේ IV වන ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාතේ පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශයේ නේවාසිකයන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,474.59 කට සමාන එජඩො මිලියන 147.45 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් මූල්‍යනය කිරීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,569.79 කට සමාන එජඩො මිලියන 23 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය වූ ඉරණමඩු වැව, මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරියත ලෙස වෙනස් කොට සිදු කළ විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම් හේතුවෙන් ව්‍යාපෘතියේ ඇතැම් කටයුතු අත්හිටුවීමට සිදු වීම නිසා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය ලබා දුන් ණය අවලංගු කරන ලදී. මේ නිසා, ආසියානු සංවර්ධන බැංකුව සමඟ ශ්‍රී ලංකා රජය 2017 දෙසැම්බර් 15 දින අතිරේක ණය ගිවිසුමකට එළඹී තිබුණි. අතිරේක ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 23,256කට සමාන එජඩො මිලියන 153 කි. ඉන් රු.මිලියන 18,240 ට සමාන එජඩො මිලියන 120 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 5,016 කට සමාන එජඩො මිලියන 33 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර එය 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘතිය කාලය 2026 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක්

සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය හා සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ණය අංක 2711 හි උපයෝජනය රු.මිලියන 7,811.45 ක් වූ අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අනුව එය රු.මිලියන 9,512.01 ක් විය. කෙසේ වුවද, රු.මිලියන 1,700.56 ක් වූ වෙනස සැසඳීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ පොත් අනුව ගිණුම් තබන ලද වියදමත්, ERD DRMS -814 වාර්තාව අනුව වාර්තා කරන ලද වියදමත් අතර වෙනසට ජ' නල් සටහන් දමා ඇති අතර ව්‍යාපෘතිය එම වියදම සැසඳුම් කිරීමට විස්තරාත්මක සැලසුම් සකස් කර තිබුණි. | ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ වියදම පමණක් සැසඳුම් කර තිබුණි. කෙසේවුවද, මුළු වෙනස සැසඳුම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ රු.මිලියන 11,033.72 ක් වූ අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 13,344.01ක් විය. ව්‍යාපෘතිය විසින් රු.මිලියන 811.05 ක් වූ සැසඳුම් නොවූ ශේෂයක් හඳුනාගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එම වෙනස නිවරැදි කිරීමට ව්‍යාපෘතිය ක්‍රියා කර නොතිබුණි. | ගනුදෙනු හඳුනාගෙන NWSDB හි කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය හා ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය සමාන කිරීම සඳහා සෑම වර්ෂයකම ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක කෙරීගෙන යන වැඩ සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කරයි. | රු.මිලියන 811.05 ක් වූ නොසැසඳූ ශේෂ සැසඳුම් කිරීමට ක්‍රියා කළ යුතය |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කාර්යයන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| කාර්යයන් | 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | |
| (අ) යාපනය නගර ප්‍රදේශය තුළ බෙදා හැරීම ජාලයේ නල එළීම. | කි.මී. 284 | කි.මී. 47 | යාපනය නගර ප්‍රදේශයේ බෙදාහැරීමේ ජාලයේ නල එළීම් 2021 මැයි 03 දින ආරම්භ කරන ලදී. මෙම කොන්ත්‍රාත්තුව යටතේ පැරණි උද්‍යාන යේ (Old Park) OIC ගොඩනැගිලි ඉදි කිරීම 95 ක ප්‍රතිශතයකින් නිම කර ඇති අතර 2022 මැයි 31 දින වන විට කි.මී. 112 ක නල එළීම් සම්පූර්ණ කරන ලදී. කෙසේ වුවද, පවත්නා ආර්ථික අර්බුධය ඉන්ධන හිඟකම හා CIDA (Construction Industry Development Authority) මිල දර්ශක ක්ෂණිකව ඉහළ යාම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය කෙරේ බලපා ඇත. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) චුන්නාකන් ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදිකිරීම. | කි.මී.50 | ලංසු ලේඛන පිළියෙල කර ඇත. | SWRO පිරියත හා M&E SCADA කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමෙන් පසු අරමුදල් ඉතිරි වේ නම් ඒ අනුව අනුව චුන්නාකන් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ලංසු ලේඛන දැන්වීම් පල කිරීමට ADB එකඟතාවය මත තීරණය කරන ලදී. කෙසේවුවද, රටෙහි පවත්නා තත්වය අනුව, වැඩ කෙරෙමින් පවතින කොන්ත්‍රාත් සහ ඇගයීම් කෙරෙන කොන්ත්‍රාත්වල සියලුම ඇස්තමේන්තුගත සහ අපේක්ෂිත පිරිවැය ක්ෂණිකව ලෙස ඉහළ ගිය අතර JKWSSP විෂය පථය තුලට මෙම ව්‍යාපෘතිය ඇතුළත් කිරීමට හැකියාවක් නොමැත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) මුහුදු ජලය ප්‍රතිවර්තා අවශෝෂණ පිරියත ඉදි කිරීම. | කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝබර් මාසයේදී අවසන් කිරීමට නියමිතය. | කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි ප්‍රදානය කර තිබුණි. | SWRO පිරියත කොන්ත්‍රාත්තුව ප්‍රදානයේදී ඇගයීම් හා අනුමැතිය ලබා ගැනීම ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස ප්‍රමාද විය. අවසානයේ SWRO කොන්ත්‍රාත්තුව 2021 ජනවාරි 25 වන දින එම්/එස් සූස් ඉන්ටර්නැෂනල් ආයතනය වෙත ප්‍රදානය කරන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ එම්/එස් සූස් ඉන්ටර්නැෂනල් අතර කොන්ත්‍රාත් ගිවිසුම 2021 පෙබරවාරි 23 වන දින අත්සන් කරන ලදි. ඉන්පසු 2021 මාර්තු 08 වන දින වැඩ ආරම්භ කරන ලදී. | ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය ප්‍රමාද වීම හේතුවෙන් රජයට බැදීම් ගාස්තු ගෙවීමට සිදුවන නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු නිම නොවුණද, 2017 වර්ෂයේ සිට ණය ආපසු ගෙවීම ආරම්භ කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 1,569.05 ක් ණය ආපසු ගෙවීම් ලෙස ණය නියෝජිතායනයට ගෙවා තිබුණි. | ණය ගිවිසුම අනුව ADB බැදීම් ගාස්තු හා ණය පොලී අය කරන අතර ණය මුල් මුදල ආපසු ගෙවිය යුතුය. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | අංක 3603 දරන ණය ගිවිසුම අත්සන් කළ දින සිට වසර 03 ක් හා මාස 6 ක් ගත වනතෙක් ව්‍යාපෘතිය එහි අරමුදල් භාවිතා කර නොමැති බව අනාවරණය විය. එම නිසා, 2021 ජුනි 21 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැදීම් ගාස්තු ලෙස රු.මිලියන 84.32 ක් ණය නියෝජිතායතනය විසින් අය කර තිබුණි. | ණය ගිවිසුම් අංක එල් 3603 හි ii ව්‍යවස්ථාව අනුව ණය ගැනුම්කරු ණය පොලී හා බැදීම් ගාස්තු ADB වෙත ගෙවිය යුතු අතර ණය මුල් මුදල ආපසු ගෙවිය යුතුය. එයට අනුකූල වීම සඳහා ADB ණය පොලී හා බැදීම් ගාස්තු අය කරන අතර විස්තර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට වාර්තා කරයි. | බැදීම් ගාස්තු අඩු කිරීම සම්බන්ධයෙන්, ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. (තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ නොවීම මත ප්‍රසම්පාදන ප්‍රමාදය සිදු වීම නිසා) |

| | | |
|---|---|---|
| (ඇ) 2017 දෙසැම්බර් සිට 2021 ජුනි 22 දක්වා ණය අංක 3603 න් කිසිදු ගෙවීමක් සිදු නොකළ ද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2021 මැයි 15 දින දක්වා ණය පොළී ලෙස රු.මිලියන 2.41 ක් අය කර තිබුණි. | දිස්ත්‍රික්කයේ ඉලක්කගත ප්‍රතිලාභීන්ට පානීය ජලය සැපයීම සඳහා 2023 සැප්තැම්බර් අවසාන වන විට කොන්ත්‍රාත්තුව නිම කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රදාන ක්‍රියාවලිය කඩිනම් කිරීමට අප සෑම උත්සහයක්ම දරන ලදී. | ADB බැඳීම් ගාස්තු ප්‍රාග්ධනිත කරන අතර ණය උපයෝජනයක් ලෙස වාර්තා කරයි. තවද, ඔවුන් එම ප්‍රාග්ධනිත කරන වටිනාකම මත ණය පොළී අය කරයි. එම නිසා, ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ආයතන ණය නියෝජිතායතනය සමඟ මේ පිළිබඳ සාකච්ඡා කළ යුතුය. |

### 3.3 පරිබාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| විදුලි බල සැපයුම් විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නාගදීප SWRO පිරියත විවෘත කිරීමේ පුවත්පත් දැන්වීම් සඳහා මෙම ව්‍යාපෘතියේ දේශීය අරමුදලින් රු. මිලියන 1.11 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘති දැනුවත් කිරීම යටතේ ගිණුම් අංශය රු.1,112,112 ක් JKWSSP වෙත නිදහස් කරන ලදී. | ව්‍යාපෘති වියදම් කාර්යක්ෂමව ඵලදායීව හා ආර්ථිකව කළමනාකරණය කර ගත යුතුය. |

### 3.4 පද්ධතිය සහ පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 5 ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2018 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය විගණනය සිදු කරන ලදී. 2021 පෙබරවාරි මාසයේදී ව්‍යාපෘතිය විගණනය සඳහා අභ්‍යන්තර විගණන අංශය පැමිණීමට නියමිතව තිබුණි. කොවිඩ් - 19 වසංගත තත්වය මත රට තුළ පළාත් සංචරණ සීමා පැනවීමෙන් ඔවුන්ට ව්‍යාපෘතිය වෙත පැමිණීමට නොහැකි විය. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3.5 පෙර විගණන වාර්තාවලින් පෙන්වාදෙන ලද නොවිසඳුනු ගැටළු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සංශෝධිත විෂය පථය අනුව, යාපනය කිලිනොච්චි ප්‍රදේශයට ජලය සැපයීම සඳහා ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කරන ලද මුහුදු ජලය ප්‍රතිවර්තා අවශෝෂණ පිරියත හා ඒ සඳහා ඉදි කරන ලද ජල කුළුණු 2022 වන විට නිම කිරීමට අපේක්ෂිත ය. එම නිසා, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,140 කට ප්‍රදානයකරන ලද ජල කුළුණු 15 ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සහ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 5,536 කට ප්‍රදානයකරන ලද නල එළීම් 2018 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද මෙම සියළු ඉදි කිරීම්, නිසි ජල මූලාශ්‍රයක් නොමැති වීමෙන් වර්ෂ තුනකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතී. | පුන්කරි, වෙලනායි, මණ්ඩතිව්, කයිට්ස් සහ පුත්තූර්හි ජල කුළුණු පවතින සීමිත ජල මූලාශ්‍ර හා සම්බන්ධ කර ඇති අතර ප්‍රතිලාභීන්ට ජලය සපයයි. ඒ සමඟම මෙම ජල කුළුණු 5 යොදා ගෙන දැනටමත් නිවාස 950 කට ගෘහස්ථ සබඳතා ලබාදී ඇත. අතිරේකව, පුන්කරි, නයිනතිවු, අනලයිතිවු සහ එලුවලතිවු ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා NWSDB හි O & M අංශය විසින් කි.මී. 44 ක් දිග සම්ප්‍රේශන නල යොදා ගෙන ඇත. | ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ඉදිකිරීම් කටයුතු අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ විවිධ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද, එම ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ හා ලීසිං ක්‍රියාවලිය සඳහා ගතවන කාලය හේතුවෙන් හිමිකම් NWSDB වෙත පවරා ගැනීම ප්‍රමාද වේ. | ඉඩම්වල අයිතිය පවරා ගැනීම සඳහා මණ්ඩලය වහාම පියවර ගත යුතුය. |